IslamHouse.com

# අල් කුර්ආන්

# සූරාත් අල් හජ් 22

සිංහල භාෂාව

පරිවර්තක: මාහිර් ටී රම්ඩීන්

විචාරක -

ඉස්ලාම් හවුස් වෙබ් අඩවියේ සංකරණ මණ්ඩලය

IslamHouse.com

# ترجمة القرآن الكريم

## سورة الحج

< السنهالية >

# القرآن الكريم

ترجمة:

ماهر رمدين

مراجعة:

محمد آساد و نخبة من العلماء الكبار

المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
هاتف: ٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس: ٩٦٦١١٤٩٧٠١٢٦+ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126

# 22 සූරත් අල් හජ් (හජ් වන්දනාව)

මදීනාවෙහි දී පහළ වූවකි .ආයාත් .කි 78

بِسْمِ اللَّهِ الرَّحْمَنِ الرَّحِيمِ

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

1-7. මළවුන් නැගිටුවනු ලබන දිනයේ සිදුවන්නා වූ අර්බුද වල දරුණුකම.

يَا أَيُّهَا النَّاسُ اتَّقُوا رَبَّكُمْ ۚ إِنَّ زَلْزَلَةَ السَّاعَةِ شَيْءٌ عَظِيمٌ {1}

අහෝ ජනයිනි! නුඹලාගේ පරමාධිපතිට නුඹලා බිය බැතිමත් වනුනියත වශයෙන්ම අවසන් . හෝරාවේ කම්පනය අතිමහත් .කරුණකි

يَوْمَ تَرَوْنَهَا تَذْهَلُ كُلُّ مُرْضِعَةٍ عَمَّا أَرْضَعَتْ وَتَضَعُ كُلُّ ذَاتِ حَمْلٍ حَمْلَهَا وَتَرَى النَّاسَ سُكَارَىٰ وَمَا هُمْ بِسُكَارَىٰ وَلَٰكِنَّ عَذَابَ اللَّهِ شَدِيدٌ {2}

නුඹලා එය දකින දින, කිරි දෙන සෑම මවක්ම තමන් කිරි දෙන අයගෙන් (තම අවධානය) තවද .වෙනතකට යොමු කරයි දරු ගැබ් ගත් සෑම කතක්ම ඇයගේ ගැබ්බර තවද නුඹ .හෙළයි (බිම) ජනයා මත් බවින් සිටිනු දකියි . නමුත් ඔවුන් මත් බවින් නොවෙති . එනමුත් අල්ලාහ්ගේ දඬුවම ඉතා .දැඩිය

وَمِنَ النَّاسِ مَنْ يُجَادِلُ فِي اللَّهِ بِغَيْرِ عِلْمٍ وَيَتَّبِعُ كُلَّ شَيْطَانٍ مَرِيدٍ {3}

තවද කිසිදු දැනුමකින් තොරව අල්ලාහ් සම්බන්ධයෙන් තර්ක කරන්නාද ජනයා අතුරින් වෙති . අකීකරු සෑම ෂෙයිතානුවෙක්ම ඔහු .අනුගමනය කරයි

كُتِبَ عَلَيْهِ أَنَّهُ مَنْ تَوَلَّاهُ فَأَنَّهُ يُضِلُّهُ وَيَهْدِيهِ إِلَىٰ عَذَابِ السَّعِيرِ {4}

තමන් භාරකරුවකු වශයෙන් ගත් අය, නියත වශයෙන්ම ඔහු තමාව නොමඟ යවනු ඇත. තවද ඇවිළෙන නිරා ගින්නේ දඬුවමට ඔහු මග පෙන්වනු ඇතැයි ඔහු

කෙරෙහි නියම කරන ලදී.

يَا أَيُّهَا النَّاسُ إِنْ كُنْتُمْ فِي رَيْبٍ مِنَ الْبَعْثِ فَإِنَّا خَلَقْنَاكُمْ مِنْ تُرَابٍ ثُمَّ مِنْ نُطْفَةٍ ثُمَّ مِنْ عَلَقَةٍ ثُمَّ مِنْ مُضْغَةٍ مُخَلَّقَةٍ وَغَيْرِ مُخَلَّقَةٍ لِنُبَيِّنَ لَكُمْ ۚ وَنُقِرُّ فِي الْأَرْحَامِ مَا نَشَاءُ إِلَىٰ أَجَلٍ مُسَمًّى ثُمَّ نُخْرِجُكُمْ طِفْلًا ثُمَّ لِتَبْلُغُوا أَشُدَّكُمْ ۖ وَمِنْكُمْ مَنْ يُتَوَفَّىٰ وَمِنْكُمْ مَنْ يُرَدُّ إِلَىٰ أَرْذَلِ الْعُمُرِ لِكَيْلَا يَعْلَمَ مِنْ بَعْدِ عِلْمٍ شَيْئًا ۚ وَتَرَى الْأَرْضَ هَامِدَةً فَإِذَا أَنْزَلْنَا عَلَيْهَا الْمَاءَ اهْتَزَّتْ وَرَبَتْ وَأَنْبَتَتْ مِنْ كُلِّ زَوْجٍ بَهِيجٍ {5}

අහෝ ජනයිනි! නැවත නැගිටුවනු ලැබීම පිළිබඳ නුඹලා සැකයක පසුවූයේ නම් එවිට දැන) ගනු ( පැහැදි (යථාර්ථය) නුඹලාටලි කරනු වස් නියත වශයෙන්ම අපි නුඹලා ව පසින්ද, පසු ව ශුක්‍රාණුවෙන්ද, පසු ව ලේ කැටියෙන් ද, පසු ව හැඩ ඇති හා හැඩ නොමැති මස් පිඩුවෙන්ද යන ) අනුපිළිවෙළින්තවද අප .මැව්වෙමු ( අභිමත කරන පරිදි නියමිත කාලයක් දක්වා අපි ගැබ්තුළ රඳවන්නෙමුපසු . ව අපි බිළිදෙකු ලෙසින් නුඹලා ව බැහැර කරන්නෙමුපසු . ව නුඹලා වැඩිවියට පත් වනු ඇතතවද . නුඹලා අතර මරණයට පත්වන්නන් ද එමෙන්ම නුඹලා අතර ඥානය ලැබීමෙන් පසු කිසිවක් නොදන්නා තරමට වයෝවෘද්ධභාවය දක්වා ආයුෂ පිරිනමනු ලබන්නන්ද වෙතිතවද නුඹ මහපොළොව . වියළි ව දකිනු ඇතඅපි ඒ මත . ජලය පහළ කළ විට එය විකසිත වී, වැඩී සරුසාර සෑම වර්ගයකින්ම පැළෑටි හට ගනියි.

ذَٰلِكَ بِأَنَّ اللَّهَ هُوَ الْحَقُّ وَأَنَّهُ يُحْيِي الْمَوْتَىٰ وَأَنَّهُ عَلَىٰ كُلِّ شَيْءٍ قَدِيرٌ {6}

එය නියත වශයෙන්ම අල්ලාහ් වන ඔහු සත්‍යය බැවිනිතවද නියත . වශයෙන්ම ඔහු මළවුන්ට ජීවය තවද නියත වශයෙන්ම ඔහු .දෙයි .සියලු දෑ කෙරෙහි ශක්තිවන්තය

وَأَنَّ السَّاعَةَ آتِيَةٌ لَا رَيْبَ فِيهَا وَأَنَّ اللَّهَ يَبْعَثُ مَنْ فِي الْقُبُورِ {7}

තවද නියත වශයෙන්ම අවසන් හෝරාව පැමිණෙන්නකිඑහි කිසිදු . තවද නියත .සැකයක් නොමැත වශයෙන්ම මිනිවළවල් තුළ සිටින්නන්ව අල්ලාහ් නැගිටුවයි.

8-10. දේව ආදේශකයින්ගේ තර්කය.

| | |
|---|---|
| කිසිදු දැනුමකින් තොර ව එමෙන්ම කිසිදු මග පෙන්වීමකින් තොර ව හා ආලෝකමත් දේව ග්‍රන්ථයකින් තොර ව අල්ලාහ් විෂයයෙහි තර්ක කරන්නන් ජනයා අතර සිටිති. | وَمِنَ النَّاسِ مَنْ يُجَادِلُ فِي اللَّهِ بِغَيْرِ عِلْمٍ وَلَا هُدًى وَلَا كِتَابٍ مُنِيرٍ {8} |
| අල්ලාහ්ගේ මාර්ගයෙන් (ඔහු) නොමග යැවීමට තම ගෙල පැත්ත වෙනතකට හරවමින් සිටියිඔහුට . .මෙලොවෙහි අවමානය ඇත තවද මළවුන් කෙරෙන් නැගිටුවනු (ගින්නේ) ලබන දිනයේ දැවෙන දඬුවම භුක්ති විඳින්නට අපි ඔහුට සලස්වන්නෙමු. | ثَانِيَ عِطْفِهِ لِيُضِلَّ عَنْ سَبِيلِ اللَّهِ ۖ لَهُ فِي الدُّنْيَا خِزْيٌ ۖ وَنُذِيقُهُ يَوْمَ الْقِيَامَةِ عَذَابَ الْحَرِيقِ {9} |
| එය නුඹගේ දෑත් ඉදිරිපත් කළ දෑ හේතුවෙනිතවද නියත වශයෙන්ම . අල්ලාහ් ගැත්තන්හට අපරාධ කරන්නෙකු නොවේ. | ذَٰلِكَ بِمَا قَدَّمَتْ يَدَاكَ وَأَنَّ اللَّهَ لَيْسَ بِظَلَّامٍ لِلْعَبِيدِ {10} |

11-16. කුහකයින්ගේ වන්දනාමාන.

| | |
|---|---|
| තවද ජනයා අතුරින් සැකය මත සිට අල්ලාහ්ට ගැතිකම් කරන්නාද වෙයියම් යහපතක් ඔහුට ඇති . වූයේ නම් එමගින් ඔහු සැනසුමට පත් වෙයිනමුත් ඔහුට යම් . අර්බුදයක් ඇති වූයේ නම්ඔහුගේ . මෙලොවෙහි .මුහුණ මත හැරී යයි හා මතු ලොවෙහි ඔහු පරාජිත විය . .ප්‍රකට ඉමහත් පරාජය එයමය | وَمِنَ النَّاسِ مَنْ يَعْبُدُ اللَّهَ عَلَىٰ حَرْفٍ ۖ فَإِنْ أَصَابَهُ خَيْرٌ اطْمَأَنَّ بِهِ ۖ وَإِنْ أَصَابَتْهُ فِتْنَةٌ انْقَلَبَ عَلَىٰ وَجْهِهِ خَسِرَ الدُّنْيَا وَالْآخِرَةَ ۚ ذَٰلِكَ هُوَ الْخُسْرَانُ الْمُبِينُ {11} |
| ඔහු අල්ලාහ් හැර තමන්ට හානියක් සිදු කළ නොහැකි එමෙන්ම තමන්ට ඵලක් නොදෙන දෑට පතයි . .එයමය අන්ත මුළාව වනුයේ | يَدْعُو مِنْ دُونِ اللَّهِ مَا لَا يَضُرُّهُ وَمَا لَا يَنْفَعُهُ ۚ ذَٰلِكَ هُوَ الضَّلَالُ الْبَعِيدُ {12} |
| ඔහුගේ ප්‍රයෝජනයට වඩා ඔහුගේ හානිය සමීප ව ඇත්තාගෙන් ඔහු පතයි එම (එසේ ඔහු පතන) . භාරකරු නපුරු වියතවද එම . .සහකරු නපුරු විය | يَدْعُو لَمَنْ ضَرُّهُ أَقْرَبُ مِنْ نَفْعِهِ ۚ لَبِئْسَ الْمَوْلَىٰ وَلَبِئْسَ الْعَشِيرُ {13} |

| | |
|---|---|
| නියත වශයෙන්ම අල්ලාහ් විශ්වාස කොට යහකම් කළවුන් ඊට යටින් ගංගා ගලා බස්නා උයන් (ස්වර්ග) නියත .වෙත ඇතුළත් කරයි වශයෙන්ම අල්ලාහ් තමන් සිතන දෑ .සිදු කරයි | إِنَّ اللَّهَ يُدْخِلُ الَّذِينَ آمَنُوا وَعَمِلُوا الصَّالِحَاتِ جَنَّاتٍ تَجْرِي مِنْ تَحْتِهَا الْأَنْهَارُ ۚ إِنَّ اللَّهَ يَفْعَلُ مَا يُرِيدُ {14} |
| මෙලොව හා මතු ලොව අල්ලාහ් ඔහුට (මුහම්මද්ට) උදව් නොකරන්නේම යැයි කවරෙකු සිතන්නේ ද, ඔහු අහස දෙසට ආධාරයක් දිගු කොට (පසුව අල්ලාහ් ඔහුට දෙන උදව් උපකාර) කපාහරිත්වා! එවිට ඔහුගේ කුමන්ත්‍රණය ඔහු කෝපය ඇති කරන දෑ ඉවත් කරනු ඇත්දැයි ඔහු බලවත්වා ! | مَنْ كَانَ يَظُنُّ أَنْ لَنْ يَنْصُرَهُ اللَّهُ فِي الدُّنْيَا وَالْآخِرَةِ فَلْيَمْدُدْ بِسَبَبٍ إِلَى السَّمَاءِ ثُمَّ لْيَقْطَعْ فَلْيَنْظُرْ هَلْ يُذْهِبَنَّ كَيْدُهُ مَا يَغِيظُ {15} |
| එලෙස අපි මෙය පැහැදිලි සංඥාවන් වශයෙන් පහළ කළෙමු . තවද නියත වශයෙන්ම අල්ලාහ් ඔහු අභිමත කරන අයට මග පෙන්වයි. | وَكَذَٰلِكَ أَنْزَلْنَاهُ آيَاتٍ بَيِّنَاتٍ وَأَنَّ اللَّهَ يَهْدِي مَنْ يُرِيدُ {16} |

17,18. සියලු මැවීම් අල්ලාහ්ට යටහත් ව සුජූද් කිරීම.

| | |
|---|---|
| නියත වශයෙන්ම විශ්වාස කළවුන් ද යුදෙව් වූවන් ද සාබිඌන්වරු ද කිතුනුවන් ද ගිනි පුදන්නන් ද ආදේශ කළවුන් ද නියත වශයෙන්ම අල්ලාහ් මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දින ඔවුන් අතර වෙන් කරයිනියත . වශයෙන්ම අල්ලාහ් සියලු දෑ .කෙරෙහි නිරීක්ෂකය | إِنَّ الَّذِينَ آمَنُوا وَالَّذِينَ هَادُوا وَالصَّابِئِينَ وَالنَّصَارَىٰ وَالْمَجُوسَ وَالَّذِينَ أَشْرَكُوا إِنَّ اللَّهَ يَفْصِلُ بَيْنَهُمْ يَوْمَ الْقِيَامَةِ ۚ إِنَّ اللَّهَ عَلَىٰ كُلِّ شَيْءٍ شَهِيدٌ {17} |
| අහස්හි සිටින අය ද මහපොළොවේ සිටින අය ද හිරු ද සඳු ද තාරකා ද කඳු ද ගස් ද සතුන් ද ජනයා අතුරින් බහුතරයක් දෙනා ද නියත වශයෙන්ම අල්ලාහ්ට සුජූද් කරනු නුඹ නොදුටුවෙහි දනමුත් ? බහුතරයක් දෙනා කෙරෙහි දඬුවම | أَلَمْ تَرَ أَنَّ اللَّهَ يَسْجُدُ لَهُ مَنْ فِي السَّمَاوَاتِ وَمَنْ فِي الْأَرْضِ وَالشَّمْسُ وَالْقَمَرُ وَالنُّجُومُ وَالْجِبَالُ وَالشَّجَرُ وَالدَّوَابُّ وَكَثِيرٌ مِنَ النَّاسِ |

| | |
|---|---|
| අල්ලාහ් කවරෙකු .නියම විය අවමන් කළේ ද එවිට ගරු කරන නියත .කිසිවකු ඔහුට නොමැත වශයෙන්ම අල්ලාහ් ඔහුඅභිමත කරන දෑ සිදු කරයි. | ۚ وَكَثِيرٌ حَقَّ عَلَيْهِ الْعَذَابُ ۗ وَمَنْ يُهِنِ اللَّهُ فَمَا لَهُ مِنْ مُكْرِمٍ ۚ إِنَّ اللَّهَ يَفْعَلُ مَا يَشَاءُ ۩ {18} |

19-22. දේව ප්‍රතික්ෂේපකයින් ට හිමි ප්‍රතිවිපාක.

| | |
|---|---|
| මෙම විවාදිත දෙපිරිස තම පරාමාධිපති සම්බන්ධයෙන් විවාද කළෝයඑහෙයින් ප්‍රතික්ෂේප . (නිරා) කළවුන් වන ඔවුන් හට ගින්නෙන් වූ ඇඟලුම් වෙන් කරන ලදීඔවුන්ගේ හිස් . වලට ඉහළින් උණු දිය වක් කරනු ලැබේ. | هَٰذَانِ خَصْمَانِ اخْتَصَمُوا فِي رَبِّهِمْ ۖ فَالَّذِينَ كَفَرُوا قُطِّعَتْ لَهُمْ ثِيَابٌ مِنْ نَارٍ يُصَبُّ مِنْ فَوْقِ رُءُوسِهِمُ الْحَمِيمُ {19} |
| ඔවුන්ගේ උදරයන්හි ඇති දෑ හා චර්ම එමගින් දිය කරනු ලැබේ. | يُصْهَرُ بِهِ مَا فِي بُطُونِهِمْ وَالْجُلُودُ {20} |
| තවද ඔවුනට යකඩින් වූ මුගුරු ඇත. | وَلَهُمْ مَقَامِعُ مِنْ حَدِيدٍ {21} |
| දුකින් වූ එතැනින් ඔවුන් පිටත් වීමට සිතූ සෑම අවස්ථාවකම ඔවුහු නැවත යොමු කරනු ලබතිතවද . නුඹලා දැවෙන ගින්නේ දඬුවම භුක්ති විඳිනු (.යැයි පවසනු ලැබේ) | كُلَّمَا أَرَادُوا أَنْ يَخْرُجُوا مِنْهَا مِنْ غَمٍّ أُعِيدُوا فِيهَا وَذُوقُوا عَذَابَ الْحَرِيقِ {22} |

23,24. දේව විශ්වාසවන්තයින් ට හිමි ප්‍රතිඵල.

| | |
|---|---|
| ඊට පහළින් ගංගා ගලා බස්නා උයන් (ස්වර්ග) වලට, විශ්වාස කොට යහකම් කළවුන් නියත වශයෙන්ම අල්ලාහ් ඇතුළත් කරයි . එහි රනින් වූ වළලු ද මුතු ද ඔවුනට පලඳවනු ලැබේඑහි ඔවුන්ගේ . .ඇඟලුම් සේදය | إِنَّ اللَّهَ يُدْخِلُ الَّذِينَ آمَنُوا وَعَمِلُوا الصَّالِحَاتِ جَنَّاتٍ تَجْرِي مِنْ تَحْتِهَا الْأَنْهَارُ يُحَلَّوْنَ فِيهَا مِنْ أَسَاوِرَ مِنْ ذَهَبٍ وَلُؤْلُؤًا ۖ وَلِبَاسُهُمْ فِيهَا حَرِيرٌ {23} |
| තවද ප්‍රකාශයෙන් පිවිතුරු දෑ වෙතට ඔවුහු මග පෙන්වනු ලැබූහ . තවද ප්‍රශංසනීය මාවත වෙත ද ඔවුහු මග පෙන්වනු ලැබූහ . | وَهُدُوا إِلَى الطَّيِّبِ مِنَ الْقَوْلِ وَهُدُوا إِلَىٰ صِرَاطِ الْحَمِيدِ {24} |

25-26. මස්ජිදුල් හරාමය, දේව ආදේශකයින් එයින් හා අල්ලාහ්ගේ මාර්ගයෙන් වැළැක්වීම.

إِنَّ الَّذِينَ كَفَرُوا وَيَصُدُّونَ عَنْ سَبِيلِ اللَّهِ وَالْمَسْجِدِ الْحَرَامِ الَّذِي جَعَلْنَاهُ لِلنَّاسِ سَوَاءً الْعَاكِفُ فِيهِ وَالْبَادِ ۚ وَمَنْ يُرِدْ فِيهِ بِإِلْحَادٍ بِظُلْمٍ نُذِقْهُ مِنْ عَذَابٍ أَلِيمٍ {25}

නියත වශයෙන්ම ප්‍රතික්ෂේප කොට ජනයා වෙනුවෙන් එහි රැඳී සිටින්නන්හට හා පිටස්තරයන්හට සමාන ලෙසින් අපි පත් කළ ශුද්ධ වූ මස්ජිදයෙන් හා අල්ලාහ්ගේ මාර්ගයෙන් වළක්වන්නන් ද එම ) තවද (.දඬුවමට භාජනය වනු ඇත කවරෙකු සාපරාධී ලෙසින් එහි කෙලසීමට සිතන්නේ ද වේදනීය දඬුවමකින් භුක්ති විඳින්නට අපි ඔහුට සලස්වමු.

وَإِذْ بَوَّأْنَا لِإِبْرَاهِيمَ مَكَانَ الْبَيْتِ أَنْ لَا تُشْرِكْ بِي شَيْئًا وَطَهِّرْ بَيْتِيَ لِلطَّائِفِينَ وَالْقَائِمِينَ وَالرُّكَّعِ السُّجُودِ {26}

(කෑබා ව නම්) ගෘහයේ ස්ථානය ගැන ඉබ්‍රාහීම්ට අපි පැහැදිලි කළ අවස්ථාව සිහිපත් කරනු. එවිට මට කිසිවක් ආදේශ නොකරනු .තවද නුඹ) කෑබා ව වටා (තවාෆ් කරන්නන්හටත් නැගිට නැමදුම් ඉටු කරන්නන් හටත්) කොන්ද නමා දණහිස් අල්ලා (රුකූඃ කරන්නන් හටත්) නළල බිම තබා (සුජූද් කරන්නන්හටත් මාගේ ගෘහය පිරිසිදු කරනු. (යැයි පැවසීය.)

27-29. හජ් ඉටු කිරීමේ නියෝගය හා හජ් වන්දනාව.

وَأَذِّنْ فِي النَّاسِ بِالْحَجِّ يَأْتُوكَ رِجَالًا وَعَلَىٰ كُلِّ ضَامِرٍ يَأْتِينَ مِنْ كُلِّ فَجٍّ عَمِيقٍ {27}

තවද හජ් ගැන ජනයා අතර නුඹ නිවේදනය කරනුඔවුහු පා . ගමනින් ද ගිරිදුර්ග ස්ථානයන්හි සිට පැමිණෙන වැහැරී ගිය සෑම ඔටුවකු මත හිඳ ද නුඹ වෙත පැමිණෙයි .

لِيَشْهَدُوا مَنَافِعَ لَهُمْ وَيَذْكُرُوا اسْمَ اللَّهِ فِي أَيَّامٍ مَعْلُومَاتٍ عَلَىٰ مَا رَزَقَهُمْ مِنْ بَهِيمَةِ الْأَنْعَامِ ۖ فَكُلُوا مِنْهَا وَأَطْعِمُوا الْبَائِسَ الْفَقِيرَ {28}

ඔවුන් සතු ප්‍රයෝජන ඔවුන් දකිනු පිණිසත් නියමිත දින ගණන් වල ගොවිපළ සතුන් අතුරින් ඔහු ඔවුනට පෝෂණය කළ දෑ කෙරෙහි අල්ලාහ්ගේ (ඒවා කපන විට) .නාමය මෙනෙහි කරනු පිණිසත්ය එහෙයින් නුඹලා එයින් අනුභව තවද අවශ්‍යතා ඇත්තා හා .කරනු දිළින්දාට ආහාර සපයනු.

ثُمَّ لْيَقْضُوا تَفَثَهُمْ وَلْيُوفُوا نُذُورَهُمْ وَلْيَطَّوَّفُوا بِالْبَيْتِ الْعَتِيقِ {29}

පසු ව ඔවුහු ඔවුන්ගේ කිලිටි ඉවත් කරත්වා! තවද ඔවුන්ගේ භාරයන් ඉටු කරත්වා! තවද ඉපැරණි ගෘහය (වන කඃබාව) වටා ඔවුහු තවාෆ් කරත්වා !

30-37. (නීතිමය වදන් අතුරිනි) අල්ලාහ්ගේ නීතී හා සංඥා වලට ගරු කිරීමේ නියමය. ආදේශ තැබීමේ වරද හා සතුන් කපන විට බිස්මි පැවසීමේ නීතිය.

ذَٰلِكَ وَمَنْ يُعَظِّمْ حُرُمَاتِ اللَّهِ فَهُوَ خَيْرٌ لَهُ عِنْدَ رَبِّهِ ۗ وَأُحِلَّتْ لَكُمُ الْأَنْعَامُ إِلَّا مَا يُتْلَىٰ عَلَيْكُمْ ۖ فَاجْتَنِبُوا الرِّجْسَ مِنَ الْأَوْثَانِ وَاجْتَنِبُوا قَوْلَ الزُّورِ {30}

කඃබාව ඉදි කිරීමේ)අරමුණඑය ( තවද කවරෙකු අල්ලාහ්ගේ .වේ පාරිශුද්ධ දෑට ගරු කරන්නේද එය ඔහුගේ පරමාධිපති අබියස ඔහුට යහපතක් වේතවද නුඹලා වෙත . පාරායනය කර පෙන්වනු ලබන දෑ හැර ගොවිපළ සතුන් නුඹලාට අනුමත කරන ලදීතවද පිළිමවල . තවද .කිලිටෙන් නුඹලා වළකිනු නුඹලා නොහොබිනා කතාවෙන් .වළකිනු

حُنَفَاءَ لِلَّهِ غَيْرَ مُشْرِكِينَ بِهِ ۚ وَمَنْ يُشْرِكْ بِاللَّهِ فَكَأَنَّمَا خَرَّ مِنَ السَّمَاءِ فَتَخْطَفُهُ الطَّيْرُ أَوْ تَهْوِي بِهِ الرِّيحُ فِي مَكَانٍ سَحِيقٍ{31}

අල්ලාහ්ට අවංකයින් ලෙසිනිඔහුට . ආදේශතබන්නන් ලෙසින් නොව . තවද කවරෙකු අල්ලාහ්ට ආදේශ තබන්නේද ඔහු අහසින් වැටෙන්නෙකු මෙනිඑවිට . පක්ෂීන් ඔහු ඩැහැ ගෙන හෝ ඔහු රැගෙන සුළඟ හමා හෝ දුර තැනකට ගෙන යන්නාක් මෙනි.

ذَٰلِكَ وَمَنْ يُعَظِّمْ شَعَائِرَ اللَّهِ فَإِنَّهَا مِنْ تَقْوَى الْقُلُوبِ {32}

තවද කවරෙකු .එයයි (සත්‍යය) අල්ලාහ්ගේ සංඥා ගරු කරන්නේ ද නියත වශයෙන්ම එය හදවත් තුළ ඇති බිය බැතිමත්කම හේතුවෙනි .

لَكُمْ فِيهَا مَنَافِعُ إِلَىٰ أَجَلٍ مُسَمًّى ثُمَّ مَحِلُّهَا إِلَى الْبَيْتِ الْعَتِيقِ {33}

නුඹලාට එහි නියමිත කාලයක් දක්වා ප්‍රයෝජන ඇතපසු . ව එය ඉපැරණි ගෘහය වෙත රැඳෙන්නක් වේ.

وَلِكُلِّ أُمَّةٍ جَعَلْنَا مَنْسَكًا لِيَذْكُرُوا

තවද සෑම සමූහයක් සඳහාම ගොවිපළ සතුන් අතුරින් ඔවුනට

اسْمَ اللَّهِ عَلَىٰ مَا رَزَقَهُمْ مِنْ بَهِيمَةِ الْأَنْعَامِ ۗ فَإِلَٰهُكُمْ إِلَٰهٌ وَاحِدٌ فَلَهُ أَسْلِمُوا ۗ وَبَشِّرِ الْمُخْبِتِينَ {34}

ඔහු පෝෂණය කළ දෑ මත අල්ලාහ්ගේ නාමය මෙනෙහි කරනු පිණිස නැමදුම් පිළිවෙතක් අපි ඇති කළෙමුඑහෙයින් නුඹලාගේ . එහෙයින් .දෙවිඳුන් එකම දෙවිඳුන්ය තවද .නුඹලා ඔහුට අවනත වනු යටහත් පහත්වූවනට (,නබිවරය) නුඹ ශුභාරංචි දන්වනු .

الَّذِينَ إِذَا ذُكِرَ اللَّهُ وَجِلَتْ قُلُوبُهُمْ وَالصَّابِرِينَ عَلَىٰ مَا أَصَابَهُمْ وَالْمُقِيمِي الصَّلَاةِ وَمِمَّا رَزَقْنَاهُمْ يُنْفِقُونَ {35}

ඔවුහු වනාහි අල්ලාහ් මෙනෙහි කරනු ලබන විට ඔවුන්ගේ හදවත් තැති ගනියිතවද ඔවුනට ඇති වන . .දෑ මත ඉවසිලිවන්තයින් වෙති සලාතය විධිමත් ව ඉටු කරන්නන් වෙතිතවද අපි ඔවුනට පෝෂණය . .කළ දැයින් ඔවුහු වියදම් කරති

وَالْبُدْنَ جَعَلْنَاهَا لَكُمْ مِنْ شَعَائِرِ اللَّهِ لَكُمْ فِيهَا خَيْرٌ ۖ فَاذْكُرُوا اسْمَ اللَّهِ عَلَيْهَا صَوَافَّ ۖ فَإِذَا وَجَبَتْ جُنُوبُهَا فَكُلُوا مِنْهَا وَأَطْعِمُوا الْقَانِعَ وَالْمُعْتَرَّ ۚ كَذَٰلِكَ سَخَّرْنَاهَا لَكُمْ لَعَلَّكُمْ تَشْكُرُونَ {36}

තවද ඔටුවන් අපි ,එය නුඹලාට අල්ලාහ්ගේ සංඥා අතුරින් පත් කළෙමුනුඹලාට එහි යහපතක් . එහෙයින් නුඹලා උන් .ඇත පෙළගස්වා උන් මත අල්ලාහ්ගේ නාමය මෙනෙහි කරනුඋන්ගේ . ඇලපත් වැටෙන්නට නියම වූ විට තවද .නුඹලා ඉන් අනුභව කරනු මුදිත වූ අයට හා ඉල්ලා සිටින්නාට ආහාර සපයනුඑලෙස නුඹලා . කෘතවේදී විය හැකි වනු පිණිස අපි නුඹලාට උන් වසඟ කර දුන්නෙමු.

لَنْ يَنَالَ اللَّهَ لُحُومُهَا وَلَا دِمَاؤُهَا وَلَٰكِنْ يَنَالُهُ التَّقْوَىٰ مِنْكُمْ ۚ كَذَٰلِكَ سَخَّرَهَا لَكُمْ لِتُكَبِّرُوا اللَّهَ عَلَىٰ مَا هَدَاكُمْ ۗ وَبَشِّرِ الْمُحْسِنِينَ {37}

උන්ගේ මාංශ හෝ උන්ගේ රුධිරය හෝ අල්ලාහ් වෙත නොලැබෙන්නේමයඑනමුත් ඔහු . වෙත ලැබෙනුයේ නුඹලා අතුරින් වූ බිය බැතිමත්කමයිනුඹලාට ඔහු . මග පෙන්වූ දෑ වෙනුවෙන් නුඹලා අල්ලාහ් ව ශ්‍රේෂ්ඨත්වයට පත් කරනු පිණිස අපි උන් වසඟ කර දුන්නෙමු තවද දැහැමියන්හට . නබිවරය)!නුඹ ශුභාරංචි දන්වා ( .සිටිනු

إِنَّ اللَّهَ يُدَافِعُ عَنِ الَّذِينَ آمَنُوا ۗ

විශ්වාස කළවුන් ඔවුනට අත්) වන

හානියෙන්නියත වශයෙන්ම (
නියත .අල්ලාහ් වළක්වාලයි
වශයෙන්මඅල්ලාහ් ගුණමකු සෑම
ද්‍රොහියෙකුවම ප්‍රිය නොකරයි.

إِنَّ اللَّهَ لَا يُحِبُّ كُلَّ خَوَّانٍ كَفُورٍ {38}

38-41. දේව විශ්වාසවන්තයින් සඳහා වූ අල්ලාහ් ආරක්ෂා ව හා උපකාරය.

සටන් කරන්නන්හට අනුමැතිය
දෙන ලදී. හේතුව නියත වශයෙන්ම
ඔවුන් අපරාධයට භාජනය කරනු
ලැබූ හෙයිනිතවද නියත .
වශයෙන්ම අල්ලාහ් ඔවුනට උදව්
.කිරීමට ශක්තිවන්තය

أُذِنَ لِلَّذِينَ يُقَاتَلُونَ بِأَنَّهُمْ ظُلِمُوا ۚ وَإِنَّ اللَّهَ عَلَىٰ نَصْرِهِمْ لَقَدِيرٌ {39}

ඔවුහු අපගේ පරමාධිපති අල්ලාහ්
වේ යැයි පැවසීම හේතුවෙන් මිස
කිසිදු යුක්තියකින් තොර ව
ඔවුන්ගේ නිවෙස් වලින් ඔවුන්
බැහැර කරනු ලැබූවන් වෙති .
ඇතැමෙකු විසින් ,ජනයා
ඇතැමෙකු ව අල්ලාහ්
නොවැළැක්වූයේ නම් ආශ්‍රම,
කිතුනු දේවස්ථාන, යුදෙව් නැමදුම්
ස්ථාන හා අල්ලාහ්ගේ නාමය අධික
ව එහි මෙනෙහි කරනු ලබන
මස්ජිදයන් විනාශ කරනු ලබන්නට
තිබුණිකවරෙකු ඔහුට උදව් .
කරන්නේ ද නියත වශයෙන්ම
.අල්ලාහ් ඔහුට උදව් කරනු ඇත
නියත වශයෙන්ම අල්ලාහ්
අතිබලවත්ය, සර්ව බලධාරීය.

الَّذِينَ أُخْرِجُوا مِنْ دِيَارِهِمْ بِغَيْرِ حَقٍّ إِلَّا أَنْ يَقُولُوا رَبُّنَا اللَّهُ ۗ وَلَوْلَا دَفْعُ اللَّهِ النَّاسَ بَعْضَهُمْ بِبَعْضٍ لَهُدِّمَتْ صَوَامِعُ وَبِيَعٌ وَصَلَوَاتٌ وَمَسَاجِدُ يُذْكَرُ فِيهَا اسْمُ اللَّهِ كَثِيرًا ۗ وَلَيَنْصُرَنَّ اللَّهُ مَنْ يَنْصُرُهُ ۗ إِنَّ اللَّهَ لَقَوِيٌّ عَزِيزٌ {40}

ඔවුහු වනාහි මහපොළොවෙහි අපි
ඔවුනට බලය ලබා දුන්නේ නම්
ඔවුහු සලාතය විධිමත් ව ඉටු කරති .
තවද<sup></sup>සකාත් පිරිනමතිතවද .
යහපත විධානය කොට අයහපතින්
සියලු කරුණු .වළක්වති වල
අවසානය අල්ලාහ් සතුය.

الَّذِينَ إِنْ مَكَّنَّاهُمْ فِي الْأَرْضِ أَقَامُوا الصَّلَاةَ وَآتَوُا الزَّكَاةَ وَأَمَرُوا بِالْمَعْرُوفِ وَنَهَوْا عَنِ الْمُنْكَرِ ۗ وَلِلَّهِ عَاقِبَةُ الْأُمُورِ {41}

42-48. පෙර විසූ සමූහයන් විනාශයට පත් වීම හා ඔවුන්ගෙන් ගත යුතු පාඩම්.

තවද ඔවුහු නුඹ ව බොරු කරන්නේ
නම් එවිට නුඹ දැන) ගනුඔවුනට (

وَإِنْ يُكَذِّبُوكَ فَقَدْ كَذَّبَتْ قَبْلَهُمْ

قَوْمُ نُوحٍ وَعَادٌ وَثَمُودُ {42}

පෙර නුහ්ගේ ජනයා ද ආද් ජනයා ද හා සමූද් ජනයාද ද සැබැවින්ම බොරු (ඔවුන්ගේ නබිවරුන්) .කළෝය

وَقَوْمُ إِبْرَاهِيمَ وَقَوْمُ لُوطٍ {43}

තවද ඉබ්‍රාහීම්ගේ ජනයා ද ලූත්ගේ ජනයා ද

وَأَصْحَابُ مَدْيَنَ ۖ وَكُذِّبَ مُوسَىٰ فَأَمْلَيْتُ لِلْكَافِرِينَ ثُمَّ أَخَذْتُهُمْ ۖ فَكَيْفَ كَانَ نَكِيرِ {44}

තවද මද්යන් වාසීහු ද බොරු ) තවද මූසාද බොරු කරනු (කළෝය එවිට දේව ප්‍රතික්ෂේපක .ලැබීය යින්හට මම අවකාශය දුනිම්පසු . ව මම ඔවුන් ග්‍රහණය කළෙමිඑවිට . ?මාගේ දඬුවම කෙසේ වීද

فَكَأَيِّنْ مِنْ قَرْيَةٍ أَهْلَكْنَاهَا وَهِيَ ظَالِمَةٌ فَهِيَ خَاوِيَةٌ عَلَىٰ عُرُوشِهَا وَبِئْرٍ مُعَطَّلَةٍ وَقَصْرٍ مَشِيدٍ {45}

කොපමණ ගම්මානයන් වී දඑය ? අපරාධකරමින් සිටිය දී අපි විනාශ කළෙමු එවිට එහි .උඩු වියන් මත ගරා වැටිනතවද හැර . දමන ලද ළිං හා පාළු වී ගිය මන්දිර ද විය .

أَفَلَمْ يَسِيرُوا فِي الْأَرْضِ فَتَكُونَ لَهُمْ قُلُوبٌ يَعْقِلُونَ بِهَا أَوْ آذَانٌ يَسْمَعُونَ بِهَا ۖ فَإِنَّهَا لَا تَعْمَى الْأَبْصَارُ وَلَٰكِنْ تَعْمَى الْقُلُوبُ الَّتِي فِي الصُّدُورِ {46}

ඔවුහු මහපොළොවේ ගමන් කළ යුතු නොවේ දඑවිට එමගින් වටහා ? ගත හැකි අයුරින් සිත් හා එමගින් සවන් දිය හැකි අයුරින් කන්ද ඇස් අන්ධ .ඔවුනට පිහිටනු ඇත නොවෙයිනමුත් හදවත් තුළ ඇති . සිත් අන්ධ වෙයි.

وَيَسْتَعْجِلُونَكَ بِالْعَذَابِ وَلَنْ يُخْلِفَ اللَّهُ وَعْدَهُ ۚ وَإِنَّ يَوْمًا عِنْدَ رَبِّكَ كَأَلْفِ سَنَةٍ مِمَّا تَعُدُّونَ {47}

තවද ඔවුහු එම දඬුවම ඉක්මන් කරන මෙන් ඔබගෙන් පතති . අල්ලාහ් ඔහුගේ පොරොන්දුව කඩ නොකරන්නේමයනියත . වශයෙන්ම නුඹගේ පරමාධිපති අබියස එක් දිනයක් නුඹලා ගණනය කරන අවුරුදු දාහකට සමානය.

وَكَأَيِّنْ مِنْ قَرْيَةٍ أَمْلَيْتُ لَهَا وَهِيَ

කෙතරම් ගම්මානයන් වීදඑය ? අපරාධකරමින් සිටිය දී එයට මම පසු .කල් දුනිම් ව මම එය ග්‍රහණය

ظَالِمَةٌ ثُمَّ أَخَذْتُهَا وَإِلَيَّ الْمَصِيرُ {48}

කළෙමිතවද නැවත පැමිණීමේ .
.ස්ථානය ඇත්තේ මා වෙතය

### 49. රසූල්වරයාගේ වැදගත්කම.

قُلْ يَا أَيُّهَا النَّاسُ إِنَّمَا أَنَا لَكُمْ نَذِيرٌ مُبِينٌ {49}

අහෝ ජනයිනි! නියත වශයෙන්ම මම නුඹලාට පැහැදිලි අවවාද කරන්නෙකු පමණය යැයි (,නබිවරය)නුඹ පවසනු.

### 50. දේව විශ්වාසවන්තයින්ගේ ප්‍රතිඵල

فَالَّذِينَ آمَنُوا وَعَمِلُوا الصَّالِحَاتِ لَهُمْ مَغْفِرَةٌ وَرِزْقٌ كَرِيمٌ {50}

එහෙයින් විශ්වාස කොට යහකම් කළවුන් වනාහි ඔවුනට සමාව ද ගෞරවනීය සංග්‍රහය ද ඇත.

### 51. දේව ප්‍රතික්ෂේපකයින්ගේ විපාක.

وَالَّذِينَ سَعَوْا فِي آيَاتِنَا مُعَاجِزِينَ أُولَٰئِكَ أَصْحَابُ الْجَحِيمِ {51}

තවද අපගේ වදන් නිෂ්ඵල කරන්නට උත්සාහ දැරුවන් වන ඔවුහුමය නිරයේ සගයෝ.

### 52-57. නබිවරුන් අතර ෂෙයිතාන්ගේ ස්ථාවරත්වය. ඔහු හේතුවෙන් සෑම කෙනෙකුටම අයත් වන අවසන් ඉරණම.

وَمَا أَرْسَلْنَا مِنْ قَبْلِكَ مِنْ رَسُولٍ وَلَا نَبِيٍّ إِلَّا إِذَا تَمَنَّىٰ أَلْقَى الشَّيْطَانُ فِي أُمْنِيَّتِهِ فَيَنْسَخُ اللَّهُ مَا يُلْقِي الشَّيْطَانُ ثُمَّ يُحْكِمُ اللَّهُ آيَاتِهِ ۗ وَاللَّهُ عَلِيمٌ حَكِيمٌ {52}

තමන් පාරායනය කරන විට ෂෙයිතාන් ඔහුගේ මනෝ ආශාවන්හි හෙළමින් මිස (වැරදි) අපි කිසිදු රසූල්වරයකු හෝ .නබිවරයකු හෝ නොඑව්වෙමු එවිට ෂෙයිතාන් හෙළන දෑ අල්ලාහ් නිෂ්ප්‍රභ කරයිපසු . ව අල්ලාහ් ඔහුගේ වදන් තීන්දු කරයිතවද . අල්ලාහ් සර්ව ඥානීය මහා ප්‍රඥාවන්තය.

لِيَجْعَلَ مَا يُلْقِي الشَّيْطَانُ فِتْنَةً لِلَّذِينَ فِي قُلُوبِهِمْ مَرَضٌ وَالْقَاسِيَةِ قُلُوبُهُمْ ۗ وَإِنَّ الظَّالِمِينَ لَفِي شِقَاقٍ بَعِيدٍ {53}

තම හදවත් තුළ රෝගී බව ඇති අයට හා තම හදවත් දැඩිවූවන්හට ෂෙයිතාන් හෙළන දෑ පරීක්ෂණයක් බවට ඔහු පත් කරනු පිණිසයතවද . නියත වශයෙන්ම අපරාධකරුවන් .අන්ත බෙදීම් තුළ වෙති

තවද සැබැවින්ම මෙය නුඹගේ පරමාධිපතිගෙන් වූ සත්‍යය බව ඥානය දෙනු ලැබූවන් දැනගෙන එය විශ්වාස කොට ඔවුන්ගේ හදවත් එයට යටහත් වනු පිණිස. (මෙසේ සිදු කරනු ඇත.) තවද නියත වශයෙන්ම අල්ලාහ් විශ්වාස කළවුනට ඍජු මාර්ගය වෙත මග පෙන්වන්නාය .

وَلِيَعْلَمَ الَّذِينَ أُوتُوا الْعِلْمَ أَنَّهُ الْحَقُّ مِنْ رَبِّكَ فَيُؤْمِنُوا بِهِ فَتُخْبِتَ لَهُ قُلُوبُهُمْ ۗ وَإِنَّ اللَّهَ لَهَادِ الَّذِينَ آمَنُوا إِلَىٰ صِرَاطٍ مُسْتَقِيمٍ {54}

ප්‍රතික්ෂේප කළවුන් ක්ෂණික ව ඔවුන් වෙත අවසන් හෝරාව පැමිණෙන තෙක් හෝ නිසරු දිනයක දඬුවම ඔවුන් වෙත පැමිණෙන තෙක් හෝ ඒ ගැන සැකයෙන් ඉවත් නොවෙති .

وَلَا يَزَالُ الَّذِينَ كَفَرُوا فِي مِرْيَةٍ مِنْهُ حَتَّىٰ تَأْتِيَهُمُ السَّاعَةُ بَغْتَةً أَوْ يَأْتِيَهُمْ عَذَابُ يَوْمٍ عَقِيمٍ {55}

එදින සියලු බලය අල්ලාහ් සතුය . ඔවුන් අතර ඔහු තීන්දු දෙයි . එහෙයින් විශ්වාස කොට යහකම් කළවුන් වනාහි ඔවුහු සැප පහසුකම් .උයන්හි වෙති (ස්වර්ග) ඇති

الْمُلْكُ يَوْمَئِذٍ لِلَّهِ يَحْكُمُ بَيْنَهُمْ ۚ فَالَّذِينَ آمَنُوا وَعَمِلُوا الصَّالِحَاتِ فِي جَنَّاتِ النَّعِيمِ {56}

තවද ප්‍රතික්ෂේප කොට අපගේ වදන් බොරු කළවුන් වනාහි ඔවුනට අවමන් සහගත දඬුවමක් ඇත.

وَالَّذِينَ كَفَرُوا وَكَذَّبُوا بِآيَاتِنَا فَأُولَٰئِكَ لَهُمْ عَذَابٌ مُهِينٌ {57}

58-60. අල්ලාහ් වෙනුවෙන් තම දේශයෙන් නික්ම ගියවුනට හිමි ප්‍රතිඵල.

තවද අල්ලාහ්ගේ මාර්ගයේ නික්ම ගොස් ඝාතනය කරනු ලැබූවන් හෝ මියගියවුන් වනාහි නියත වශයෙන්ම අල්ලාහ් ඔවුනට යහපත් පෝෂණයකින් පෝෂණය කරනු ඇතතවද නියත වශයෙන්ම . අල්ලාහ් පෝෂණය කරන්නන් .අතුරින් ඉතා ශ්‍රේෂ්ඨය

وَالَّذِينَ هَاجَرُوا فِي سَبِيلِ اللَّهِ ثُمَّ قُتِلُوا أَوْ مَاتُوا لَيَرْزُقَنَّهُمُ اللَّهُ رِزْقًا حَسَنًا ۚ وَإِنَّ اللَّهَ لَهُوَ خَيْرُ الرَّازِقِينَ {58}

ඔවුහු ඒ ගැන තෘප්තියට පත් වන පිවිසුමකින් ඔවුන් ව ඔහු ඇතුළත් කරනු ඇතතවද . නියත වශයෙන්ම අල්ලාහ් සර්ව ඥානී, මහත් කුළුණැතිය.

لَيُدْخِلَنَّهُمْ مُدْخَلًا يَرْضَوْنَهُ ۗ وَإِنَّ اللَّهَ لَعَلِيمٌ حَلِيمٌ {59}

ඔවුන්ගේ)තිළිණයතවද .එයයි (
කවරෙකු කවර දෙයකින් දඬුවම්
කරනු ලැබුවේ ද ඒ හා සමාන ව
ඔහුට දඬුවම් කොට පසු ව ඔහු
කෙරෙහි සීමාව ඉක්මවා කටයුතු
කළේ ද එවිට අල්ලාහ් ඔහුට උදව්
කරනු ඇතනියත වශයෙන්ම .
අල්ලාහ් නොසලකා හරින
අතික්ෂමාශීලීය.

ذَٰلِكَ وَمَنْ عَاقَبَ بِمِثْلِ مَا عُوقِبَ
بِهِ ثُمَّ بُغِيَ عَلَيْهِ لَيَنْصُرَنَّهُ اللَّهُ ۗ
إِنَّ اللَّهَ لَعَفُوٌّ غَفُورٌ {**60**}

61-66. අල්ලාහ්ගේ ශක්තිය විදහා පෑම හා ඔහු තම ගැත්තන් වෙත පිරිනමා ඇති භාග්‍යයන්.

එය නියත වශයෙන්ම අල්ලාහ්
රාත්‍රිය දහවලෙහි ඇතුළු කරන
බැවින්ද දහවල රාත්‍රිය තුළ ඇතුළු
කරන බැවින්ද වේතවද නියත .
වශයෙන්ම අල්ලාහ් සර්ව ශ්‍රාවකය.
සර්ව නිරීක්ෂකය.

ذَٰلِكَ بِأَنَّ اللَّهَ يُولِجُ اللَّيْلَ فِي النَّهَارِ
وَيُولِجُ النَّهَارَ فِي اللَّيْلِ وَأَنَّ اللَّهَ
سَمِيعٌ بَصِيرٌ {**61**}

එය නියත වශයෙන්ම අල්ලාහ් වන
ඔහුම සත්‍යය බැවිනිතවද .
ඔහුගෙන් තොර ව ඔවුන් අයදින දෑ
නිෂ්ඵල දෑමයතවද නියත .
වශයෙන්ම අල්ලාහ් උත්තරීතරය.
අති ශ්‍රේෂ්ඨය.

ذَٰلِكَ بِأَنَّ اللَّهَ هُوَ الْحَقُّ وَأَنَّ مَا
يَدْعُونَ مِنْ دُونِهِ هُوَ الْبَاطِلُ وَأَنَّ
اللَّهَ هُوَ الْعَلِيُّ الْكَبِيرُ {**62**}

නියත වශයෙන්ම අල්ලාහ් අහසින්
ජලය පහළ කොට එවිට
මහපොළොව සරුසාරවත් වීම නුඹ
නොදුටුවෙහි දනියත වශයෙන්ම ?
අල්ලාහ් මෛත්‍රිය.
අභිඥානවන්තය.

أَلَمْ تَرَ أَنَّ اللَّهَ أَنْزَلَ مِنَ السَّمَاءِ
مَاءً فَتُصْبِحُ الْأَرْضُ مُخْضَرَّةً ۗ إِنَّ
اللَّهَ لَطِيفٌ خَبِيرٌ {**63**}

අහස් තුළ ඇති දෑ ද මහපොළොව
තුළ ඇති දෑද ඔහු සතුයතවද නියත .
වශයෙන්ම අල්ලාහ් වන ඔහුමය
අවශ්‍යතාවන්ගෙන් තොර
ප්‍රශංසාලාභී වනුයේ.

لَهُ مَا فِي السَّمَاوَاتِ وَمَا فِي الْأَرْضِ
ۗ وَإِنَّ اللَّهَ لَهُوَ الْغَنِيُّ
الْحَمِيدُ {**64**}

මහපොළොවේ ඇති දෑ ද ඔහුගේ
නියෝගය තුළින් මුහුදේ ගමන්
කරන නැව් ද අල්ලාහ් නුඹලාට
වසඟ කර දී ඇති බව නුඹ

أَلَمْ تَرَ أَنَّ اللَّهَ سَخَّرَ لَكُمْ مَا فِي
الْأَرْضِ وَالْفُلْكَ تَجْرِي فِي الْبَحْرِ

| | |
|---|---|
| නොදුටුවෙහි දඹහුගේ ? අනුබලයෙන් තොර ව මහපොළොව මතට අහස කඩා නොවැටෙන සේ ඔහු රඳවා තබයි . නියත වශයෙන්ම අල්ලාහ් ජනයා කෙරෙහි සෙනෙහෙවන්තය. මහා කරුණාවන්තය. | بِأَمْرِهِ وَيُمْسِكُ السَّمَاءَ أَنْ تَقَعَ عَلَى الْأَرْضِ إِلَّا بِإِذْنِهِ ۗ إِنَّ اللَّهَ بِالنَّاسِ لَرَءُوفٌ رَحِيمٌ {65} |
| නුඹලාට ජීවය ලබා දී පසු ව නුඹලා ව මරණයට පත් කොට ඉන්පසු ව යළි නුඹලාට ජීවය ලබා දෙනුයේ ඔහුයනියත වශයෙන්ම මිනිසා . .ගුණමකුය | وَهُوَ الَّذِي أَحْيَاكُمْ ثُمَّ يُمِيتُكُمْ ثُمَّ يُحْيِيكُمْ ۗ إِنَّ الْإِنْسَانَ لَكَفُورٌ {66} |

67-72. දේව ආදේශකයින් තම අවශ්‍යතා සපුරා ගැනීමෙහිලා පිළිපදින ක්‍රමවේදය ගැන දේව වදන් මගින් ඉදිරිපත් කිරීම.

| | |
|---|---|
| සෑම සමූහයකටම ඔවුන් ඔහුට නමදින අයුරින් නැමදුම් පිළිවෙතක් අපි ඇති කළෙමුඑහෙයින් එම . කරුණ සම්බන්ධයෙන් ඔවුහු නුඹ සමග ගැටලු ඇති කර ගත නොයුතුයතවද නුඹගේ . පරමාධිපති වෙත නුඹ ඇරයුම් නියත වශයෙන්ම නුඹ ඍජු .කරනු .මාර්ගය මතය | لِكُلِّ أُمَّةٍ جَعَلْنَا مَنْسَكًا هُمْ نَاسِكُوهُ ۖ فَلَا يُنَازِعُنَّكَ فِي الْأَمْرِ ۚ وَادْعُ إِلَىٰ رَبِّكَ ۖ إِنَّكَ لَعَلَىٰ هُدًى مُسْتَقِيمٍ {67} |
| තවද ඔවුහු නුඹ සමග තර්ක කළේ නම් එවිට නුඹලා කරන දෑ පිළිබඳ ව අල්ලාහ් මැනවින් දන්නා බව නුඹ පවසනු. | وَإِنْ جَادَلُوكَ فَقُلِ اللَّهُ أَعْلَمُ بِمَا تَعْمَلُونَ {68} |
| මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ නුඹලා කවර විෂයක් මත ගැටුම් ඇති කර ගත්තේද ඒ ගැන අල්ලාහ් නුඹලා අතර තීන්දු කරයි. | اللَّهُ يَحْكُمُ بَيْنَكُمْ يَوْمَ الْقِيَامَةِ فِيمَا كُنْتُمْ فِيهِ تَخْتَلِفُونَ {69} |
| නියත වශයෙන්ම අල්ලාහ් අහස්හි හා මහපොළොවෙහි ඇති දෑ දන්නා බව නුඹ නොදන්නෙහිදනියත ? ලව්හුල් මහ්ෆූල් ) වශයෙන්ම එය .දේව සටහනෙහි විය (හෙවත් නියත වශයෙන්ම අල්ලාහ් වෙත .එය පහසු කාර්යයකි | أَلَمْ تَعْلَمْ أَنَّ اللَّهَ يَعْلَمُ مَا فِي السَّمَاءِ وَالْأَرْضِ ۗ إِنَّ ذَٰلِكَ فِي كِتَابٍ ۚ إِنَّ ذَٰلِكَ عَلَى اللَّهِ يَسِيرٌ {70} |

| | |
|---|---|
| තවද අල්ලාහ්ගෙන් තොර කිසිදු බලයක් එයට පහළ නොකළා වූ දෑට හා ඒ ගැන කිසිදු දැනුමක් නොමැති දෑට ඔවුහු ගැතිකම් කරති . තවද අපරාධකරුවන්හට කිසිදු උදව් කරුවකු නොමැත. | وَيَعْبُدُونَ مِنْ دُونِ اللَّهِ مَا لَمْ يُنَزِّلْ بِهِ سُلْطَانًا وَمَا لَيْسَ لَهُمْ بِهِ عِلْمٌ ۗ وَمَا لِلظَّالِمِينَ مِنْ نَصِيرٍ {71} |
| තවද ඔවුන් වෙත අපගේ වදන් පැහැදිලි ලෙස පාරායනය කර පෙන් වනු ලබන විට ප්‍රතික්ෂේප කළවුන්ගේ මුහුණුවල පිළිකුල් බව නුඹ දකිනු ඇතඔවුන් වෙත අපගේ . වදන් පාරායනය කර පෙන්වන්නන් හට පහර දීමට ඔවුහු තැත් කරති . එහෙයින් නුඹ පවසනු. මීට වඩා නපුරු දෙයක් පිළිබඳ නුඹලාට මම දන්වන්නම්ද) ?එයදේව ( ප්‍රතික්ෂේපකයින්හට අල්ලාහ් යොමු .ගින්නය (නිරා) ප්‍රතිඥා කළ වන ස්ථානය නපුරු විය. | وَإِذَا تُتْلَىٰ عَلَيْهِمْ آيَاتُنَا بَيِّنَاتٍ تَعْرِفُ فِي وُجُوهِ الَّذِينَ كَفَرُوا الْمُنْكَرَ ۖ يَكَادُونَ يَسْطُونَ بِالَّذِينَ يَتْلُونَ عَلَيْهِمْ آيَاتِنَا ۗ قُلْ أَفَأُنَبِّئُكُمْ بِشَرٍّ مِنْ ذَٰلِكُمُ ۗ النَّارُ وَعَدَهَا اللَّهُ الَّذِينَ كَفَرُوا ۖ وَبِئْسَ الْمَصِيرُ {72} |

73-76. අල්ලාහ් හැර ඔවුන් නැමදීමට ගත් පිළිම සඳහා උදාහරණය.

| | |
|---|---|
| අහෝ ජනයිනිඋපමාවක් ගෙන , හැර පෙන්වන ලදීඑහෙයින් . නියත .නුඹලා එයට සවන් දෙනු වශයෙන්ම අල්ලාහ්ගෙන් තොර ව නුඹලා ඇරයුම් කරන අය ඔවුන් සියලු දෙනා එකතු වුවද මැස්සෙකු හෝ ඔවුනට මැවිය නොහැක්කේමයමැස්සා . ඔවුන්ගෙන් යමක් පැහැර ගත්තේ නම් උගෙන් එය ඔවුහු මුදවා අයැදින්නා හා අයැදිනු .නොගනිති ලබන්නා දු◌ුර්වල විය. | يَا أَيُّهَا النَّاسُ ضُرِبَ مَثَلٌ فَاسْتَمِعُوا لَهُ ۚ إِنَّ الَّذِينَ تَدْعُونَ مِنْ دُونِ اللَّهِ لَنْ يَخْلُقُوا ذُبَابًا وَلَوِ اجْتَمَعُوا لَهُ ۖ وَإِنْ يَسْلُبْهُمُ الذُّبَابُ شَيْئًا لَا يَسْتَنْقِذُوهُ مِنْهُ ۚ ضَعُفَ الطَّالِبُ وَالْمَطْلُوبُ {73} |
| අල්ලාහ් ව ගරු කළ යුතු ප්‍රමාණයට ඔවුහු ඔහුට ගරු නොකළෝය . නියත වශයෙන්ම අල්ලාහ් අති බලවත් සර්ව බලධාරීය. | مَا قَدَرُوا اللَّهَ حَقَّ قَدْرِهِ ۗ إِنَّ اللَّهَ لَقَوِيٌّ عَزِيزٌ {74} |
| මලක්වරුන් අතුරින් අල්ලාහ් දූතවරුන් තෝරා ගත්තේය . | اللَّهُ يَصْطَفِي مِنَ الْمَلَائِكَةِ رُسُلًا |

| | |
|---|---|
| وَمِنَ النَّاسِ ۚ إِنَّ اللَّهَ سَمِيعٌ بَصِيرٌ {75} | (එසේ) එමෙන්ම ජනයා අතුරින්ද නියත වශයෙන්ම අල්ලාහ් .විය .සර්ව ශ්‍රාවක සර්ව නිරීක්ෂකය |
| يَعْلَمُ مَا بَيْنَ أَيْدِيهِمْ وَمَا خَلْفَهُمْ ۗ وَإِلَى اللَّهِ تُرْجَعُ الْأُمُورُ {76} | ඔවුන් අතර ඇති දෑ හා ඔවුනට පසුපසින් ඇති දෑ ඔහු දනියි තවද . සියලු කරුණු යොමු කරනු ලබනුයේ අල්ලාහ් වෙතය . |

77,78. දේව විශ්වාසවන්තයින් සඳහා දේව මග පෙන්වීම් ඉදිරිපත් කිරීම.

| | |
|---|---|
| يَا أَيُّهَا الَّذِينَ آمَنُوا ارْكَعُوا وَاسْجُدُوا وَاعْبُدُوا رَبَّكُمْ وَافْعَلُوا الْخَيْرَ لَعَلَّكُمْ تُفْلِحُونَ {77} ۩ | අහෝ විශ්වාස කළවුනි! නුඹලා ජය ලැබිය හැකි වනු පිණිස නුඹලා )කොන්ද නමා (රුකූඋ කරනු තවද . තවද .සුජූද් කරනු (නළල බිම තබා) නුඹලාගේ පරමාධිපතිට ගැතිකම් .තවද යහකම් සිදු කරනු .කරනු |
| وَجَاهِدُوا فِي اللَّهِ حَقَّ جِهَادِهِ ۚ هُوَ اجْتَبَاكُمْ وَمَا جَعَلَ عَلَيْكُمْ فِي الدِّينِ مِنْ حَرَجٍ ۚ مِلَّةَ أَبِيكُمْ إِبْرَاهِيمَ ۚ هُوَ سَمَّاكُمُ الْمُسْلِمِينَ مِنْ قَبْلُ وَفِي هَٰذَا لِيَكُونَ الرَّسُولُ شَهِيدًا عَلَيْكُمْ وَتَكُونُوا شُهَدَاءَ عَلَى النَّاسِ ۚ فَأَقِيمُوا الصَّلَاةَ وَآتُوا الزَّكَاةَ وَاعْتَصِمُوا بِاللَّهِ هُوَ مَوْلَاكُمْ ۖ فَنِعْمَ الْمَوْلَىٰ وَنِعْمَ النَّصِيرُ {78} | තවද නුඹලා අල්ලාහ්ගේ මාර්ගයේ කැප විය යුතු නියම අයුරින් කැපවනුඔහු නුඹලා . ව තෝරා ගෙන ඇතනු .ඔලා වෙත දහමෙහි කිසිදු දුෂ්කරත්වක් ඔහු ඇති නොකළේයඑය නුඹලාගේ . පියාණන් වූ ඉබ්‍රාහීම්ගේ මීට පෙර මුස්ලිම්වරුන් .පිළිවෙතයි .යැයි නුඹලාට නම් තැබුවේ ඔහුය මේ අනුවම රසූල්වරයා නුඹලාට සාක්ෂිකරුවකු වනු පිණිසත් නුඹලා ජනයාට සාක්ෂිකරුවන් වනු පිණිසත් නම් තැබීය).එහෙයින් ( නුඹලා විධිමත් ලෙස සලාතය ඉටු තවද .කරනුzසකාත් පිරිනමනු . තවද අල්ලාහ් තදින් ග්‍රහණය කර එම .ඔහු නුඹලාගේ භාරකරුය .ගනු එමෙන්ම එම .භාරකරු යහපත් විය .උදව්කරු යහපත් විය |